*සැ. යු.* - 2023.08.25 දින පළ වූ අංක 2347 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2023 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,348 - 2023 සැප්තැම්බර් මස 01 වැනි සිකුරාදා - 2023.09.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 878 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 882 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 සැප්තැම්බර් මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 සැප්තැම්බර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (වයඹ පළාත)

### රජයේ ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසරපත්‍ර ලැබීමට ගොවිජන පන්තියට අයත් නොවන තැනැත්තන් සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත් සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරාගැනීමට කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් **2023.11.27** දින පෙ.ව. **9.30**ට කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) දිස්ත්‍රික්කය : කුරුණෑගල

(ආ) උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය : කොබෙයිගනේ

(ඇ) ග්‍රාම නිලධාරි වසම : 1303 විතිකුලිය, 1305 වදුරුස්ස, 1312 කිතගම, 1315 මාකෙළියාව, 1322 අස්සැද්දුම

(ඈ) ඉඩම පිහිටි ගම : කුඩා විතිකුලිය, මොරගහවැව, වදුරුස්ස, වීරගම, ඉහළ කිතගම, බුලන, අස්සැද්දුම

(ඉ) ඉඩමේ නම :

(ඊ) ඉඩමේ විස්තරය : විසිරී පවතින, අනවසර භුක්තිය දරන, බෙදා දීමට හැකි රජයේ ඉඩම්

(උ) අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය : වාරිමාර්ග පහසුකම් සලසන ලද සහ වාරිමාර්ග පහසුකම් සලසා නොමැති (වාරිමාර්ග පහසුකම් සලසන ලද හා/හෝ වාරිමාර්ග පහසුකම් සලසා නොමැති)

(ඌ) අන්සතු කරනු ලබන ඒකකය : නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා අවම පර්. 15 සිට අක්කර 01 දක්වා

2. කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පහත සඳහන් පන්තිවලට අයත් පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

* නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තුවන ඉ. කො. 157 ලේඛනයේ ලියාපදිංචි වූ රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් ලබා ගැනීමට සුදුසු කාණ්ඩයට අයත් අය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර **2023.11.13** වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම්, කොබෙයිගනේ වෙත ලැබිය යුතුය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතුය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් **2023.11.27** වැනි දින පෙ.ව. **9.30** ට කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක් ම පෞද්ගලිකව පැමිණිය යුතුය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. තෝරාගනු ලබන සෑම අයදුම්කරුවෙකුට ම මුල් අවස්ථාවේ අවසර පත්‍රයක් ලැබෙන අතර එය, එහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

7. අවසර පත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක් ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබී ඇත්තේ කවර ඉඩමක් සඳහා ද, ඒ ඉඩම වෙනුවෙන් පර්චස් එකකට රු. 150ක් බැගින් ගණන් බලන මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදලට එය හිලව් කරනු ලැබේ.

ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් හා ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති ස්ථාන වලින් ද ලබා ගත හැක.

* ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොබෙයිගනේ
* ඉඩම් නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොබෙයිගනේ
* ග්‍රාම නිලධාරි, අංක 1303 විතිකුලිය, 1305 වදුරුස්ස, 1312 කිතගම, 1315 මාකෙළියාව, 1322 අස්සැද්දුම

එන්. එම්. ජේ. ප්‍රනාන්දු,
පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ).

2023 අගෝස්තු මස 18 වැනි දින දී ය.

ඉල්ලුම්පත්‍රයේ සහ දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘතිය පහතින් දක්වා ඇත.

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීමට කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1303 විතිකුලිය, 1305 වදුරුස්ස, 1312 කිතගම, 1315 මාකෙළියාව, 1322 අස්සැද්දුම යන වසම්වල පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :..........................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................

3. * ලිපිනය :..........................................................................................................

   * ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :..........................................................

   * ග්‍රාම නිලධාරි කොට්ඨාසය :..........................................................................

4. ගෘහ මූලික අංකය :..........................................................................................

5. ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................................................

6. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) :..........................................................

7. උපන් දිනය :..........................................................................................

8. විවාහක/අවිවාහක බව :..........................................................................................

9. රැකියාව :..........................................................................................

10. රැකියාව කරන ස්ථානය :..........................................................................................

11. අයදුම්කරු කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| *නම* | *අයදුම්කරුට ඇති සම්බන්ධය* | *රැකියාව* | *වාර්ෂික ආදායම රු. ශත* |
|---|---|---|---|
| | | | |

12. *ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර.-*

| *ඉඩමේ නම* | *ප්‍රමාණය* | *අයිතියේ ස්වභාවය* | *පවුලේ පළවෙනි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස්* |
|---|---|---|---|
| | | | |

(නිවාස හා දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :..........................................................................................................

14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය :- (තමාගේ ද?/බද්දට ද?/කුලියට ද/අනවසරයෙන් ද? යන වග) :..............................................

15. නිවස පිහිටි ස්ථානය :..........................................................................................................

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :..........................................................................................................

17. *ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :*

| *නම* | *වයස* | *ඉගෙනුම ලබන්නේ නම් පාසලේ/විද්‍යාලයේ නම* | *ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද ? ලබාගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල රු.:..........................................................................................................
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :..........................................................................................................
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :..........................................................................................................

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද ? තිබේ නම් පහත විස්තර සපයන්න.

| *පවුලේ සාමාජිකයාගේ නම* | *ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය* | *ඉතිරි කළ මුදල රු. ශත* |
|---|---|---|
| | | |
| | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟවන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩමේ නිවසක් ඉදිකිරීමට හෝ කෘෂිකාර්මික

කටයුතු කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු, තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍යයක් බව හෙළිවුවහොත් මගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

..........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :......................................

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

................................................,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :..................................................................................
ග්‍රාම නිලධාරී කොට්ඨාසය :..........................................

අනු අත්සන් කරමි.

..................................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :..................................................................................
ලිපිනය :..............................................................................

**17 පරිශිෂ්ඨය**

**දිවුරුම් ප්‍රකාශය**

.................................................................. දිස්ත්‍රික්කයේ .................................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක .................. ...................................................... දරන ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ .......................................................................................................ගමෙහි පදිංචි .......................................................................................................................... වන මම මෙහි ප්‍රකාශකයා වෙමි. මගේ ලිපිනය .......... ...........................................................................................................................වේ.

(1) මට, මාගේ භාර්යාවට/ස්වාමිපුරුෂයාට සහ වයස අවුරුදු 18 ට අඩු දරුවන්ට සාමූහික ව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පෞද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වන වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම, මා විසින් ඉල්ලා සිටින අක්කර ...................... රූඩ් .................... පර්. ...................... ක් පමණ වූ ඉඩම් කොටස බද්දට ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර 50 සීමාව නොඉක්මවන බව ද වැඩිදුරටත් සහතික කොට දිවුරුම් දී ප්‍රකාශ කරමි.

..........................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරුට/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

..................................................,
සාමදාන විනිශ්චයකාරතැන.

09-39

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වයඹ පළාතේ, පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2023

වයඹ පළාතේ, පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා වයඹ පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාර ව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය විෂයයන් සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම සිදු කරන අතර එක් අයදුම්කරුවකු හට උපරිම වශයෙන් උපලේඛනයේ සඳහන් විෂයයන් 3 ක් ඉල්ලුම් කළ හැක. එසේ බඳවා ගැනීමේ දී අදාළ දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

02. එසේ වුවද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂයය පුරප්පාඩු සඳහා ද, පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂයය පුරප්පාඩු සඳහා ද ඉල්ලුම් කළ යුතු ය. එසේ වුවද එක් දිස්ත්‍රික්කයක විෂයය පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් සුදුස්සන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක අනෙක් දිස්ත්‍රික්කයේ එම විෂයයන් සඳහා සුදුසුකම් ලැබූවන්ගෙන් පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

03. වයඹ පළාත වෙත බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත් ව සකසන ලද එක් එක් දිස්ත්‍රික්කයේ සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යයවලට අදාළ විෂය පුරප්පාඩු උපලේඛනයෙහි දැක්වේ.

04. උපලේඛනයේ සඳහන් ඕනෑම විෂයය පුරප්පාඩු 03 ක් සඳහා වෙනත් පළාත්වල ස්ථිර පදිංචිකරුවන්ට ද ඉල්ලුම් කළ හැකි අතර තෝරා ගැනීමේ දී අදාළ දිස්ත්‍රික්කයේ වසර 03 ක ස්ථිර පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. එක් එක් විෂයය සඳහා පුරප්පාඩු සඳහා සුදුසුකම් ලැබූවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විට, වයඹ පළාත තුළ ස්ථිර පදිංචි නමුත් වසර 03 ක පදිංචිය නොමැති අයදුම්කරුවන් සලකා බලනු ලබන අතර තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම් වෙනත් පළාත්වල පදිංචි ඒ ඒ විෂයය පුරප්පාඩු සඳහා අයදුම්කරන ලද සුදුසුකම් ලැබූවන්ගෙන් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

05. *වැටුප් ක්‍රමය.-*

මෙම තනතුරට 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (IV) හි අංක ජී. ඊ. 1- 2016-ඒ වැටුප් ඛණ්ඩයේ රු. 31,490 - 6 x 445 - 7 x 525 2 x 600 - රු. 39,035 මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය හිමිවන අතර, මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු. 37,835 වැටුප් පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ.

06. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.-*

6.1 *අධ්‍යාපන සුදුසුකම්.-*

(i) ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රමුඛතාවය මඟින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මඟින් හෝ ප්‍රදානය කරනු ලැබූ, උපලේඛනයෙ හි සඳහන් කර ඇති විෂයන්ට අදාළ උපාධියක් ලබා තිබිය යුතුය ;

*සහ*

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සහ ගණිතය විෂයයක් වශයෙන් සමත් ව තිබිය යුතුය.

***ඉතා වැදගත්.***- (ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු)

- ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතුය.
- උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතුය.
- ඕනෑම අයදුම්කරුවකු හට ඉල්ලුම් කළ හැකි උපරිම විෂයයන් සංඛ්‍යාව 3 ක් වන අතර කැමැත්තේ ප්‍රමුඛතාවය අනුව ඉල්ලුම් කළ යුතුය.

- **ඉල්ලුම් කළ විෂයය/විෂයයන් කිසිදු හේතුවක් නිසා පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.**

6.2 *කායික සහ මානසික යෝග්‍යතාවය :-*

සෑම අපේක්ෂකයෙකු ම ගුරුවරයෙකු වශයෙන් තම රාජකාරි ඉටුකිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

6.3 *වයස :-*

අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

6.4 *වෙනත් සුදුසුකම් :-*

(i) අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

(iii) වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.

(iv) අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වනවිට වයඹ පළාතේ පූර්වාසන්න අවුරුදු 03 ක ස්ථිර පදිංචි ව සිටි අයෙකු බවට ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු අතර ස්ථිර පදිංචිය වසර 03 ක් නොමැති වයඹ පළාතේ අයදුම්කරුවන් වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කාල සීමාව ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය.

(v) අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වනවිට වයඹ පළාතේ ස්ථිර පදිංචිය නොමැති වුවද කලත්‍රයාහට වයඹ පළාත තුළ ස්ථිර පදිංචිය තිබේ නම් එම අයදුම්කරුවන් පිළිබඳව ද 04 වන වගන්තිය ප්‍රකාර ව සලකා බැලේ. (කලත්‍රයාගේ පදිංචි සහතිකය හා විවාහ සහතිකය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.)

(vi) එක් එක් විෂයය පුරප්පාඩු සඳහා අයදුම්කරන ලද වෙනත් පළාත්වල ස්ථිර පදිංචි අයදුම්කරුවන් තමන් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

07. *සේවා කොන්දේසි :-*

(i) රාජ්‍ය/පළාත් සහා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හා මින් මතුවට කෙරෙන සංශෝධනවලට ද, යටත් ව තෝරාගනු ලබන උපාධිධාරි අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.

(iii) මෙම තනතුරට පත් කරනු ලබන්නන්, අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(iv) වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව උසස්වීම් සිදු කරනු ලැබේ.

(v) 2020.10.16 දිනැති රා. ප. ච. 18/2020 අනුව සේවයට පත් වී වසර 03 ක් ඇතුළත තනතුරට නියම කර ඇති දෙවෙනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(vi) පත්වීම්ලාභීන් මුල් පත්වීම ලබන පාසල අයත් අධ්‍යාපන කලාපයේ අවම වශයෙන් වසර 05 ක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම වසර 05 ක කාලය තුළ ස්ථානමාරු සඳහා ඉල්ලීම් කළ නොහැක.

(vii) තම මුල් පත්වීම ලබන පාසල අතිදුෂ්කර/දුෂ්කර පාසලක් නොවන කල් හි තම සේවා කාලය තුළ ඕනෑම අවස්ථාවක දී අවම වශයෙන් වසර 05 ක කාලයක් අතිදුෂ්කර/දුෂ්කර පාසලක සේවය කිරීමට ද පත්වීම් ලාභීන් බැඳී සිටී.

08. *බඳවා ගැනීම :-*

8.1 බඳවා ගැනීමේ ක්‍රමය :-

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

8.2 ලිඛිත තරග විභාගය : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *විෂයය අංකය* | *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01යි) | 100 | 40 |
| 02 | සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි) | 100 | 40 |

*විෂයය නිර්දේශය :-*

විෂයය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය

- අපේක්ෂකයා සතු කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය.

  (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.)

විෂයය අංක 02 - සාමාන්‍ය දැනීම

- සමාජ, ආර්ථික, දේශපාලනික ක්ෂේත්‍ර පිළිබඳව වූ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වේ.
  (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.)

8.3 විභාග පටිපාටිය :-

(i) මෙම විභාගය සඳහා සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉල්ලුම් කළ හැක.
(ii) සෑම අපේෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙක ටම (02) පෙනී සිටිය යුතු ය.
(iii) සෑම අපේක්ෂයෙකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම් ලැබීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය ම විය යුතුය.
(iv) ඉංග්‍රීසි විෂයය සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අයදුම් කළ යුතුය.
(v) අපේක්ෂයෙකුට ස්වකීය අයදුම්පතේ දක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

8.4 සම්මුඛ පරීක්ෂණය :- මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම, කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම, උපාධි පන්ති සාමර්ථ සහ අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබාදීම පිණිස මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා ලිඛිත විභාගයෙ හි ලකුණු ප්‍රමුඛතාවය අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණීමේ දී විස්තරාත්මක උපාධි සහතිකය ඉදිරිපත් කළ යුතු වේ.

(අ) පන්ති සාමාර්ථය සඳහා ලකුණු ලබා දීම (උපරිම ලකුණු 07)

I පන්තිය ලකුණු 07
II පන්තිය ඉහළ පෙළ ලකුණු 05
III පන්තිය පහළ පෙළ ලකුණු 03

(ආ) අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබාදීම (උපරිම ලකුණු 10)

| *අනු. අංකය* | *නිර්ණායකය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | දහම් පාසල් අවසාන විභාග සහතිකය හෝ වෙනත් ආගම් සඳහා ඒ හා සමාන මට්ටමේ විභාගයක් සමත් වී ඇති බවට පිළිගත් සහතිකයන් ලබා තිබීම. | 05 |
| 02 | ක්‍රීඩා, සෞන්දර්ය ආදී විෂයය සමගාමී ක්‍රියාකාරකම් සඳහා රජයේ හෝ රජය පිළිගත් ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන, තෙවන ජයග්‍රහණ සඳහා සහතික එකක් හෝ කිහිපයක් ලබා තිබීම | 05 |
| | මුළු ලකුණු | 10 |

8.5 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීම (උපරිම ලකුණු 08)

ප්‍රායෝගික පරීක්ෂණයේ දී අයදුම්කරු විසින් තමා අයදුම් කරන ලද විෂයකට අදාළ මාතෘකාවක් යටතේ විනාඩි 5 කට නොඅඩු ඉදිරිපත් කිරීමක් කළ යුතුයි. මෙහි දී අයදුම්කරු සතු අදහස් ප්‍රකාශ කිරීමේ කුසලතාව හා සන්නිවේදන කුසලතාව පිළිබඳ විශේෂයෙන් සලකා බලනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් කැඳවනු ලැබේ.

09. *විභාග මධ්‍යස්ථානය :-*

මෙම තරග විභාගය පහත දැක්වෙන නගරවල දී පවත්වනු ලැබේ. වයඹ පළාතේ ස්ථිර පදිංචිකරුවන් තමන් පදිංචි දිස්ත්‍රික්කය අනුව නගරය තෝරා ගත යුතුයි. වෙනත් පළාත්වල ස්ථිර පදිංචිකරුවන් තමන් පත්වීම් ලැබීමට මනාපය පළකරන දිස්ත්‍රික්කය තෝරා ගත යුතු ය.

| *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| කුරුණෑගල | කුරුණෑගල | 1 |
| පුත්තලම | පුත්තලම | 2 |

10. *තෝරා ගැනීමේ ක්‍රමය :-*

*(අ)* වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

*(ආ)* යම්කිසි අපේක්ෂකයෙකු ඉල්ලුම් කරන ලද විෂයන් අතරින් එක් විෂයකට වඩා වැඩි විෂයයන් ගණනකට සුදුසුකම් ලබා ඇති අවස්ථාවක එම අයට පත්වීම් ලබා දෙන විෂය පිළිබඳ ව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

11. *විභාග ගාස්තු :-*

විභාග ගාස්තු වශයෙන් රු. 1,200 ක් වයඹ පළාත් සභාවේ අංක 2003.02.13 දරන ආදායම් ශීර්ෂයට බැර වන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා තමා නමින් ලබා ගත් ව. ප. ස. මු. 02 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය. ව. ප. ස. මු. 02 ආකෘතියේ ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හා මුදල් ඇණවුම් හෝ මුදල් කිසිවක් භාරගනු නොලබන අතර එවැනි ලදුපත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදෙන බව ද, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතු ය. (මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.)

12. *අයදුම් කළ යුතු පිළිවෙල ඃ-*

12.1 *(අ) අයදුම්පත්‍රය* ඃ- සෙ. මී. 21 x 35.5 (ලීගල්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින් අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටු වලට ද, ඇතුළත් වන සේ අයදුම්පත් පිළියෙල කර ගත යුතුය.

*(ආ)* ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්, දැනුම් දීමකින් තොර ව ප්‍රතික්ෂේප කෙරේ. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*(ඇ)* අයදුම් කරනු ලබන විෂය/විෂයන්/දිස්ත්‍රික්කය කිසිසේත් වෙනස් කරනු නොලබන අතර එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

*(ඈ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය ඃ- **2023.10.02** දින වේ.

12.2 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ-

අයදුම්පතෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකරුවකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 41,580 කට වැඩි ආරම්භක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

12.3 නිවැරදි ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2023.10.02** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන්/තැපැල් කුරියර් සේවයෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිඳු අයදුම්පතක් භාරගනු නොලැබේ.

ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

අයදුම්පත බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව ''**වයඹ පළාත් සභා ගුරුසේවයට උපාධිධාරීන් බඳවා ගැනීම 2023**'' සහ පදිංචි **දිස්ත්‍රික්කය** සඳහන් කළ යුතුය.

නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා **2023.10.02** දිනට හෝ එදිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශපත්‍රයක් නිකුත් කරනු ලැබේ. එහෙත් මෙම තරග විභාගය සඳහා පෙනී සිටීමට ඉඩදීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

13. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය ඃ-*

අපේක්ෂකයින් තමා පෙනී සිටින විභාගය, සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පහත ලියවිලිවලින් තම අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

*හෝ*

*(ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය/වලංගු රියදුරු බලපත්‍රය

***සටහන*** : විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

14. ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී සැලකිලිමත් ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිඳු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම බඳවා ගැනීමේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට, පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගය පැවැත්වීමට පෙර හෝ පැවැත්වෙන අතරතුර හෝ ඉන්පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇතිබව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට හැකිවේ.

15. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග ප්‍රවේශ පත්‍ර හා ඉන්පසුව සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීම් ලිපි නිකුත් කරනු ඇත. සම්මුඛ පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර හා කැඳවීම් ලිපි නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk.) නිවේදනයක් පළ කරනු ලැබේ. ලිඛිත විභාගය, සම්මුඛ පරීක්ෂණය හා ප්‍රයෝගික පරීක්ෂණය, පැවැත්වෙන දිනට දින 3 කට පෙර ප්‍රවේශ පත්‍රය/කැඳවීම් ලිපිය නොලැබිණි නම් ඒ බව වහාම "**ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල**" යන ලිපිනයට දන්විය යුතුයි. එසේ දැනුම් දීමේ දී පහත විස්තර ඉදිරිපත් කළ යුතුය.

- i. අයදුම්කරුගේ සම්පූර්ණ නම :
- ii. ලිපිනය :
- iii. ජාතික හැඳුනුම්පත් අංකය :
- iv. අයදුම්කරුගේ දුරකථන අංකය :

16. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන හෝ එම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

17. මෙම විභාගය, පැවැත්වීම, කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

18. සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝගය පරිදි,

ඊ. එම්. පී. ඒකනායක,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2023 අගෝස්තු මස 28 වැනි දින දී ය,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
වයඹ පළාත.

උපලේඛනය

| අනු. අංකය | විෂයය | විෂයය සුදුසුකම් | කුරුණෑගල දිස්ත්‍රික්කය | | | පුත්තලම දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 1 | රසායන විද්‍යාව | සිව් අවුරුදු විශේෂ උපාධියක දී විශේෂ විෂය ලෙස හෝ වෙනත් ප්‍රධාන විෂයයක් ලෙස රසායන විද්‍යාව හදරා ඇති හෝ තුන් අවුරුදු උපාධියක දී මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක් ලෙස රසායන විද්‍යාව හදරා ඇති විද්‍යාවේදී/ව්‍යවහාරික විද්‍යාවේ දී උපාධිය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 2 | භෞතික විද්‍යාව | සිව් අවුරුදු විශේෂ උපාධියක දී විශේෂ විෂය ලෙස හෝ වෙනත් ප්‍රධාන විෂයයක් ලෙස භෞතික විද්‍යාව හදරා ඇති හෝ තුන් අවුරුදු උපාධියක දී මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් ලෙස භෞතික විද්‍යාව හදරා ඇති විද්‍යාවේදී/ව්‍යවහාරික විද්‍යාවේ දී උපාධිය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 3 | ජීව විද්‍යාව | සිව් අවුරුදු විශේෂ උපාධියක දී විශේෂ විෂය ලෙස උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව/සත්ව විද්‍යාව හදරා ඇති හා විශේෂ විෂය උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව වනවිට අනෙක් ප්‍රධාන විෂය ලෙස සත්ව විද්‍යාව ද විශේෂ විෂය සත්ව විද්‍යාව වන විට අනෙක් ප්‍රධාන විෂය ලෙස උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව ද උසස් පෙළ විෂය නිර්දේශයට අනුකූල වන පරිදි හදරා තිබීම හෝ තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක දී උද්භිද විද්‍යාව/ශාක ජීව විද්‍යාව හා සත්ත්ව විද්‍යාව යන විෂයයන් දෙකෙහිම එකතුව, මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3 ක් බැගින් උසස් පෙළ විෂය නිර්දේශයට අනුකූල වන පරිදි හදරා ඇති විද්‍යාවේදී/ව්‍යවහාරික විද්‍යාවේදී උපාධිය. | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 4 | කෘෂි විද්‍යාව | කෘෂි තාක්ෂණය හා කළමණාකරණ (B. Sc Agriculture Technology and Management)/ කෘෂිකර්ම (B. Sc Agriculture)/කෘෂි සම්පත් කළමනාකරණ හා තාක්ෂණ (B. Sc. Agricultural Resources Management and Technology/ /කෘෂි ව්‍යාපාර කළමණාකරණ (B. Sc. Agri Business Management) /අපනයන කෘෂිකර්ම (B. Sc. Export Agriculture) විද්‍යාවේදී උපාධිය හෝ උසස් පෙළ කෘෂි විද්‍යාව විෂය නිර්දේශයට අනුකූල වන පරිදි මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් ආවරණය වන විෂයයන් අන්තර්ගතවන ඕනෑම විද්‍යාවේදී උපාධියක්. | ✓ | ✓ | | ✓ | | |

| අනු. අංකය | විෂයය | විෂයය සුදුසුකම් | කුරුණෑගල දිස්ත්‍රික්කය | | | පුත්තලම දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 5 | සංයුක්ත ගණිතය | සිව් අවුරුදු විශේෂ උපාධියක දී විශේෂ විෂයය ලෙස උසස් ගණිතය හදරා තිබීම හෝ විශේෂ විෂය ව්‍යවහාරික ගණිතය වන විට අනෙක් ප්‍රධාන විෂයයක් ලෙස ශුද්ධ ගණිතය ද විශේෂ විෂය ශුද්ධ ගණිතය වන විට අනෙක් ප්‍රධාන විෂයයක් ලෙස ව්‍යවහාරික ගණිතය ද හදාරා තිබීම හෝ තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක දී ව්‍යවහාරික ගණිතය සහ ශුද්ධ ගණිතය යන විෂයයන් දෙකෙහි ම එකතුව මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3 බැගින් හදරා ඇති විද්‍යාවේදී /ව්‍යවහාරික විද්‍යාවේ දී උපාධියක් | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| 6 | ඉංජිනේරු තාක්ෂණවේදය | උපාධියෙහි මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් ඉදිකිරීම්, යාන්ත්‍රික, විදුලි හා/හෝ ඉලෙක්ට්‍රොනික් යන විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි හදරා ඇති ඉංජිනේරු/තාක්ෂණවේදී/ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය. | ✓ | ✓ | | ✓ | | |
| 7 | ජෛව පද්ධති තාක්ෂණවේදය | කෘෂි තාක්ෂණය හා කළමනාකරණ (B. Sc Agricultural Technology and Management)/ කෘෂිකර්ම (B. Sc Agriculture)/කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණ (B. Sc. Agricultural Resources Management and Technology) පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය (BBST) හෝ උසස් පෙළ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය නිර්දේශයට අනුකූල වන පරිදි මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් ආවරණය වන විෂයයන් අන්තර්ගත වන ඕනෑම විද්‍යාවේ දී උපාධියක්. | ✓ | | | | | |
| 8 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක් භෞතික විද්‍යාව අන්තර්ගත වන විද්‍යාවේදී/ව්‍යවහාරික විද්‍යාවේදී උපාධිය | ✓ | | | ✓ | | |
| 9 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | සිව් අවුරුදු විශේෂ උපාධියක දී විශේෂ විෂයය ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/පරිගණක විද්‍යාව හෝ වෙනත් ප්‍රධාන විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/පරිගණක විද්‍යාව හදරා ඇති හෝ තුන් අවුරුදු උපාධියක දී මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3ක් වන සේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදරා ඇති උපාධියක්. | ✓ | ✓ | ✓ | ✓ | | |
| 10 | ඉංග්‍රීසි | ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය හෝ සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ම ඉංග්‍රීසි/ඉංග්‍රීසි සාහිත්‍ය ප්‍රධාන විෂයයක් ලෙස හදරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධියක්. | | | ✓ | | | ✓ |

| අනු. අංකය | විෂයය | විෂයය සුදුසුකම් | කුරුණෑගල දිස්ත්‍රික්කය | | | පුත්තලම දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 11 | අරාබි | අදාළ විෂය ප්‍රධාන විෂය සහිත භාෂා උපාධියක් හෝ අදාළ විෂයයට විශේෂ උපාධියක් ලබා තිබීම | | ✓ | | | | |
| 12 | ප්‍රංශ | | ✓ | | | | | |
| 13 | චීන | | ✓ | | | | | |
| 14 | ජපන් | | ✓ | | | ✓ | | |
| 15 | ජර්මන් | | ✓ | | | | | |
| 16 | රුසියන් | | ✓ | | | | | |
| 17 | හින්දි | | ✓ | | | | | |
| 18 | කොරියන් | | ✓ | | | ✓ | | |
| 19 | විශේෂ අධ්‍යාපනය | විශේෂ අධ්‍යාපනය පිළිබඳ උපාධිය හෝ අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ උපාධිය හෝ කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ වාග් විද්‍යාව පිළිබඳ උපාධිය හෝ ළමා මනෝ විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිත උපාධිය. | ✓ | | | ✓ | | |
| 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනට (වෘත්තීය විෂයය ධාරාව) අදාළ විෂයයන් | | | | | | | | |
| 20 | ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය | ළමා මනෝ විද්‍යාව විෂයය/ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය ප්‍රධාන විෂයයක් සහිත උපාධියක් ලබා තිබීම. | ✓ | | | ✓ | ✓ | |
| 21 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය ප්‍රධාන විෂයයක් සහිත උපාධියක් ලබා තිබීම. | ✓ | | | ✓ | ✓ | |
| 22 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | ශාරීරික අධ්‍යාපනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය/ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය/ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ප්‍රධාන විෂයය සහිත උපාධියක් ලබා තිබීම. | ✓ | | | ✓ | ✓ | |
| 23 | ප්‍රාසාංගික කලාව | ප්‍රාසාංගික කලාව පිළිබඳ විශේෂ උපාධිය හෝ ප්‍රාසාංගික කලා/ලලිත කලා/නර්තනය/සංගීතය විෂය සහිත ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය හෝ නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය හෝ ප්‍රාසංගික කලාව/ලලිත කලාව ප්‍රධාන විෂයය සහිත උපාධියක් ලබා තිබීම. | ✓ | | | | | |

| අනු. අංකය | විෂයය | විෂයය සුදුසුකම් | කුරුණෑගල දිස්ත්‍රික්කය | | | පුත්තලම දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 24 | ශිල්ප කලා | චිත්‍ර, මූර්ති, මුද්‍රණ කලා, රෙදිපිළි හා රෙදිපිළි ආශ්‍රිත කලා ආදී විෂය සහිත දෘශ්‍ය කලාව පිළිබඳ විශේෂ උපාධිය හෝ චිත්‍ර කලාව සහ ග්‍රැෆික් පිළිබඳ දෘශ්‍ය කලා හා සැලසුම්කරණ විශේෂ උපාධිය හෝ දෘශ්‍ය හා තාක්ෂණ කලාව පිළිබඳ විශේෂ උපාධිය හෝ චිත්‍ර කලා/ග්‍රැෆික්/මූර්ති/දෘෂ්‍ය හා තාක්ෂණික කලාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ ප්‍රධාන විෂයයක් ලෙස හදරා ඇති ශාස්ත්‍රවේදී හෝ ලලිතකලාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම. | | | | ✓ | | |
| 25 | අභ්‍යන්තර නිර්මාණකරණය | ගෘහ නිර්මාණ ශිල්ප විෂය පිළිබඳ විද්‍යාවේදී/ නිර්මාණවේදී උපාධිය හෝ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ උපාධිය හෝ අභ්‍යන්තර නිර්මාණකරණය ප්‍රධාන විෂයය සහිත උපාධියක් ලබා තිබීම | | | | ✓ | | |
| 26 | විලාසිතා නිර්මාණකරණය | රෙදිපිළි හා ඇඟලුම් කලා පිළිබඳ දෘශ්‍ය කලා විශේෂ උපාධිය/නිර්මාණවේදී උපාධිය/විලාසිතා නිර්මාණකරණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පිළිබඳ උපාධිය/විලාසිතා නිර්මාණකරණය ප්‍රධාන විෂයය සහිත උපාධියක් ලබා තිබීම | ✓ | | | ✓ | | |
| 27 | ග්‍රැෆික් නිර්මාණකරණය | ග්‍රැෆික් නිර්මාණකරණය ප්‍රධාන විෂය සහිත උපාධිය හෝ නිර්මාණවේදී උපාධිය/දෘශ්‍ය කලා හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (චිත්‍ර සහ ග්‍රැෆික්) පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය/පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය/තොරතුරු හා සන්නිවේදන හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය/උපාධියට ප්‍රධාන විෂයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ඇතුළත් උපාධිය/පරිගණක විද්‍යාව විෂය ඇතුළත් විද්‍යාවේදී උපාධිය (ඉහත සඳහන් උපාධි පාඨමාලාවන්හි මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් ග්‍රැෆික් නිර්මාණකරණය සහිත විෂය කොටස් හදාරා සමත් ව තිබිය යුතුය. | ✓ | | | ✓ | | |
| 28 | භූ දර්ශන නිර්මාණකරණය | උද්‍යාන විද්‍යාව/භූදර්ශන නිර්මාණකරණය විෂය සහිත කෘෂි විද්‍යා උපාධිය හෝ භූ දර්ශන නිර්මාණකරණය ප්‍රධාන විෂය සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | ✓ | ✓ | | ✓ | | |
| 29 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | උද්‍යාන විද්‍යාව/භූ දර්ශන නිර්මාණකරණය විෂය සහිත කෘෂි විද්‍යා උපාධිය/ ව්‍යාවහාරික උද්‍යාන විද්‍යාව ප්‍රධාන විෂය සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම | ✓ | | | ✓ | | |

| අනු. අංකය | විෂයය | විෂයය සුදුසුකම් | කුරුණෑගල දිස්ත්‍රික්කය | | | පුත්තලම දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 30 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | සත්ත්ව විද්‍යාව/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය විෂයය සහිත කෘෂි විද්‍යා උපාධිය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය හෝ සත්ත්ව නිෂ්පාදන හා ආහාර තාක්ෂණය/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයය සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | ✓ | | | | | |
| 31 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | ආහාර විද්‍යාව හා තාක්ෂණවේදී උපාධිය හෝ ආහාර හා පෝෂණය පිළිබඳ උපාධිය හෝ ආහාර විද්‍යාව/ ආහාර නිෂ්පාදන තාක්ෂණය විෂයය සහිත කෘෂි විද්‍යා උපාධිය හෝ ආහාර නිෂ්පාදන තාක්ෂණය/ආහාර සැකසුම් තාක්ෂණවේදය ප්‍රධාන විෂයය සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | ✓ | | | ✓ | | |
| 32 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | ජලජ සම්පත් කළමනාකරණය හා සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ සත්ත්ව විද්‍යාව/පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය/ජලජ සම්පත් තාක්ෂණය විෂය සහිත කෘෂි විද්‍යා උපාධිය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ ධීවර හා සාගර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ ජලජ සම්පත් තාක්ෂණය ප්‍රධාන විෂයය සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | ✓ | | | | | |
| 33 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | අපනයන කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණය විෂය සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | ✓ | | | ✓ | | |
| 34 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය විෂයය සහිත ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ තාක්ෂණවේදී උපාධිය හෝ ඉදිකිරීම් තාක්ෂණය ප්‍රධාන විෂයය සහිත උපාධිය හෝ ඕනෑම උපාධියක් සමග අවු 2 ක් හෝ ඊට වැඩි පාඨමාලා කාලයක් සහිතව හෝ අවම වශයෙන් NVQ 4 හෝ ඊට ඉහළ මට්ටමේ ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම. | ✓ | ✓ | | ✓ | ✓ | |
| 35 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | මෝටර් යාන්ත්‍රික තාක්ෂණවේදී උපාධිය හෝ මෝටර් යාන්ත්‍රික විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය හෝ මෝටර් යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂය සහිත උපාධියක් ලබා තිබීම. | ✓ | ✓ | | ✓ | ✓ | |
| 36 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ ව්‍යාහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය පිළිබඳ ප්‍රධාන විෂයය සහිත උපාධියක් ලබා තිබීම. | ✓ | ✓ | | ✓ | | |

| අනු. අංකය | විෂයය | විෂයය සුදුසුකම් | කුරුණෑගල දිස්ත්‍රික්කය | | | පුත්තලම දිස්ත්‍රික්කය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| 37 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | නිර්මාණවේදී උපාධිය හෝ පේෂකර්ම හා රෙදිපිළි පිළිබඳ ඉංජිනේරු විද්‍යා උපාධිය හෝ තාක්ෂණවේදී උපාධිය හෝ පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය ප්‍රධාන විෂයය සහිත උපාධියක් ලබා තිබීම. | | ✓ | | | | |
| 38 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | යාන්ත්‍රික තාක්ෂණවේ දී උපාධිය හෝ යාන්ත්‍රික තාක්ෂණවේදය ප්‍රධාන විෂය සහිත සාමාන්‍ය උපාධිය හෝ ලෝහ සැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂය සහිත උපාධිය හෝ ඕනෑම උපාධියක් සමඟ අවම වශයෙන් NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ ලෝහ සැකසුම් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම. | ✓ | | | | | |
| 39 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | සිවිල්/ඉදිකිරීම්/යාන්ත්‍රික විෂය සහිත තාක්ෂණවේදී උපාධිය හෝ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂය සහිත උපාධිය හෝ ඕනෑම උපාධියක් සමඟ අවම වශයෙන් NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම. | | ✓ | | ✓ | | |
| 40 | පරිගණක දෘඩාංග සහ ජාලකරණය | වසර තුනක කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය/පරිගණක විද්‍යාව/පරිගණක ඉංජිනේරු විද්‍යාව විෂය සහිත උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විෂය කොටස් හදාරා තිබීම) හෝ වසර හතරක කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය/පරිගණක විද්‍යාව/පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාළ විෂය කොටස් හදාරා තිබීම) හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති විද්‍යාවේ දී/තාක්ෂණවේ දී/උපාධියක් ලබා තිබීම හා එහි මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක වටිනාකමක් සහිතව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර හදාරා තිබීම)<br>*විෂය ක්ෂේත්‍ර :* Computer Hardware (ii) Computer system Engineering (iii) Computer Networks (iv) Computer Architecture (v) Operating System (vi) Electronics Network related Project (vii) Arduino Technology (viii) IT Security (ix) Network Security (x) Information Security (xi) Cyber Security (xii) Computer Hardware and network related projects. | ✓ | | | ✓ | ✓ | |
| 41 | සංචරණය හා ආගන්තුක සත්කාර | විද්‍යාවේදී සංචාරක කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධිය හෝ සත්කාරක සේවා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය පිළිබඳ පරිපාලනවේදී උපාධිය හෝ ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සිද්ධි පිළිබඳ කළමනාකරණ උපාධිය හෝ සංචාරක කළමනාකරණ උපාධිය හෝ සංචාරක සහ සංස්කෘතික සම්පත් කළමනාකරණ උපාධිය හෝ සංචරණය හා ආගන්තුක සත්කාර ප්‍රධාන විෂය සහිත උපාධියක් ලබා තිබීම. | ✓ | | | ✓ | ✓ | |

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා [ ]

**වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම - 2023**

01. **ස්ථිර පදිංචිය :-**

| *වයඹ පළාත තුළ පදිංචි නම්* |
|---|
| ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- [ ] |
| නගර අංකය :- [ ] |
| නගර අංකය :- කුරුණෑගල : 01<br>පුත්තලම : 02 |

| *වෙනත් පළාතක පදිංචි නම්* |
|---|
| ස්ථිර පදිංචි පළාත :- [ ] |
| අයදුම්කිරීමට අපේක්ෂිත දිස්ත්‍රික්කය :- [ ] |
| නගර අංකය :- [ ] |

02. **විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :**

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E [ ]

(පත්වීම් ලැබීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයට අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

03. ***ඉල්ලුම්කරන විෂය/විෂයයන් :***

| *ප්‍රමුඛතා අනුපිළිවෙල* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

(ඉල්ලුම් කළ හැකි උපරිම විෂයයන් ගණන 03 කි.)

04. ***පෞද්ගලික තොරතුරු.-***

4.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :- ..............................................................................
..............................................................................

4.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..............................................................................
..............................................................................

4.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ..............................................................................
..............................................................................

4.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................................................................
..............................................................................

4.5 වර්තමාන ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ..............................................................................................................
..............................................................................................................
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

4.6 වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................................................................................................
..............................................................................................................

4.7 දුරකථන අංකය :..............................................................................................

4.8 වට්ස්ඇප් (Whatsapp) අංකය :..............................................................................

4.9 පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.....................................................................

ග්‍රාම නිලධාරි කොට්ඨාසය :.......................................................................................

4.10 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4.11 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

4.12 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

4.13 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ : M ස්ත්‍රී : F ☐ (අදාළ අක්ෂරය කොටුව තුළ යොදන්න)

4.14 විවාහක/අවිවාහක බව : විවාහක - 2
අවිවාහක - 1 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ***ලබා ඇති උපාධිය පිළිබඳ විස්තර :***

5.1 උපාධිය : ..............................................................................................................
5.2 උපාධිය ලබා ගත් විශ්වවිද්‍යාලය : ....................................................................................
5.3 උපාධියට හදාරන ලද ප්‍රධාන විෂය/විෂයයන් :

| |
|---|
| |
| |
| |
| |
| |

5.4 ලබා ඇති පන්ති සාමාර්ථය :.....................................................................................

5.5 උපාධිය වලංගුවන දිනය :........................................................................................

5.6 උපාධිය හදාරන ලද භාෂා මාධ්‍යය :.............................................................................

5.7 අ.පො.ස. (සා. පෙළ) ප්‍රතිඵල ඃ

| | සමත් වූ වර්ෂය | විභාග අංකය |
|---|---|---|
| පළමු වර | | |
| දෙවන වර | | |

| | විෂයය | පළමු වර සාමාර්ථය | දෙවන වර සාමාර්ථය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |

5.8 අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල ඃ

සමත් වූ වර්ෂය ඃ..........................................
විභාග අංකය ඃ.............................................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

06. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ඃ

6.1 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඃ..........................................................................................
6.2 ලදුපත් අංකය හා දිනය ඃ..........................................................................................
6.3 ගෙවූ මුදල ඃ..........................................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න)

07 ***අයදුම්කරුගේ සහතිකය ඃ***

(අ) විභාග ගාස්තු සඳහාවන නියමිත මුදල් ප්‍රාදේශීය ලේකම් වෙත ලබාගත් කුවිතාන්සිය මෙහි අලවා ඇති බව සහතික කරමි. තව ද මෙම විභාගය සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකග වෙමි.

(ආ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත්, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත් මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරන බවත් ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි පාඩුව විඳ දරා ගැනීමට මම එකග වෙමි.

(ඇ) ම'විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව මම දනිමි. මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහකිරීමට යටත්වන බව ද මම දනිමි.

දිනය ඃ........................ ................................................
අයදුම්කරුගේ අත්සන.

08. ***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :***

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ...................................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ..................................... වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

........................................................
සහතික කරන්නාගේ
අත්සන.

දිනය :...................................................................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :...................................................................................
තනතුර :...................................................................................
ලිපිනය :...................................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

09. ***අයදුම්කරු රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :***

................................................................................... මහතා/මහත්මිය/ මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දැනුම් දෙමි.

......................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව

දිනය :...................................................................................
තනතුර :...................................................................................
ලිපිනය :...................................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

09-141

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2023 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **සැප්තැම්බර්** | 2023.09.01 | සිකුරාදා | 2023.08.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.08 | සිකුරාදා | 2023.08.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.15 | සිකුරාදා | 2023.09.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.22 | සිකුරාදා | 2023.09.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.27 | බදාදා | 2023.09.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2023.10.06 | සිකුරාදා | 2023.09.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.10.13 | සිකුරාදා | 2023.09.27 | බදාදා | දහවල් | 12.00 |
| | 2023.10.20 | සිකුරාදා | 2023.10.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.10.27 | සිකුරාදා | 2023.10.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2023.11.03 | සිකුරාදා | 2023.10.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.10 | සිකුරාදා | 2023.10.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.17 | සිකුරාදා | 2023.11.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.11.24 | සිකුරාදා | 2023.11.10 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.